**වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
---------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 14 වන දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබූ පුස්තකාල පොත් සඳහා ලැබී තිබූ රු.108,379 ක වට්ටම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | වැය කළ මුදල පමණක් ගිණුම් ගතකර ඇත. |
| (ii) | කර්මාන්ත 02 කට අදාළ 10% ක රඳවුම් මුදල ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ගිණුමේ හා කර්මාන්ත ණයහිමි ගිණුමේ රු.111,766 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | කර්මාන්ත ක්‍රියාත්මක කිරීම මත 2019 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (iii) | සභාව සතු රු.185,000 ක ට්‍රැක්ටර් ට්‍රේලරයක තට්ටුව විකුණා තිබුණ ද, එහි පිරිවැය ගණනය කර, ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිරිවැය ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | පුනරාවර්තන විෂයක් සේ සළකා ගිණුම් ගතකර ඇත. |

(ආ) **නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි ශේෂයෙහි ඇතුළත්ව තිබූ රු.200,000 ක වටිනාකම වූ ප්‍රජා ශාලා ගොඩනැගිල්ල සහිත ඉඩමෙහි වටිනාකම විධිමත් අනුමැතියකින් තොරව 2018 වර්ෂයේ දී පොත්වලින් කපාහැර තිබූ අතර, ගිණුමේ සඳහන් වටිනාකම හා උපලේඛනයෙහි සඳහන් වටිනාකම අතර රු.200,000 ක වෙනසක් දක්නට ලැබුණි. | කපා හැරීමට විධිමත් අනුමැතියක් තිබිය යුතු අතර, ලේඛනවල වටිනාකම නිවැරදි කරගත යුතු වේ. | සභා තීරණයක් මත සත්‍යාපන මණ්ඩලයක් මඟින් ඉඩමෙහි වටිනාකම ඉවත්කර ඇති අතර, ලේඛනවල වෙනසක් නොමැත. |

(ඇ) **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) **ලැබිය යුතු ගිණුම්** | | |
| මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින ලැබිය යුතු රු.745,538 ක් වූ ප්‍රාග්ධන ආධාර මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කරගත යුතු වේ. | මුද්දර ගාස්තු ලබා ගැනීම සම්බන්ධව ප්‍රධාන ලේකම් කිහිප විටක් දැනුවත් කර ඇත. |
| (ii) **ගෙවිය යුතු ගිණුම්** | | |
| 2014 හා 2016 වර්ෂයන්ට අදාළ එකතු වටිනාකම රු.444,108 ක් වූ ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කරගත යුතු වේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ගෙවීම් කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර, ලද විගස ගෙවීම් නිරවුල් කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.106,150,752 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | සථ්‍යාපන මණ්ඩලයක් මඟින් ගිණුම් ශේෂ තහවුරු කර ඇත. |

## 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | - | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශයක් දෙසැම්බර් 31 දිනට පිළියෙල කර නොතිබුණි. | විචලනයට හේතුව සමඟ සැසඳීම් ප්‍රකාශ ඉදිරිපත් කළයුතු වේ. | අවසන් ගිණුම් සමඟ සැසඳීම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 702(3) | - | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේ දී ගිවිසුම්වල පිටපත් ඉදිරිපත් කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.3,494,186 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.3,582,178 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 19,000 | 19,026 | 5,803 | 100,713 | 320,000 | 18,835 | 35,940 | 87,491 |
| කුලී | 788,000 | 58,200 | 56,700 | 1,750 | 1,175,200 | 43,200 | 43,200 | 250 |
| බලපත්‍ර ගාස්තු | 94,000 | 510,400 | 518,750 | 7,000 | 187,500 | 493,050 | 480,950 | 15,350 |
| | 901,000 | 587,626 | 581,253 | 109,463 | 1,682,700 | 555,085 | 560,090 | 103,091 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ මුළු ආදායම රු.103,091 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.587,626 ක් විය. මේ අනුව වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.690,717 ක් වුවද, රැස්කළ ආදායම රු.581,253 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය සියයට 84 ක්ව පැවැතුණි. | හිඟ ආදයම් කඩිනමින් අයකර ගත යුතු වේ. | එකඟ වෙමි. |

**2.2.3** **වරිපනම් හා බදු**

-----------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව වරිපනම් කළාප ප්‍රකාශයට පත් කරවා ගෙන වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | සභා පනතේ වගන්ති පරිදි කටයුතු කර වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සංවර්ධිත ප්‍රදේශයක් වූ වහාම වරිපනම් ගැසට් කරමි. |

**2.2.4** **අක්කර බදු**

---------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| වර්ෂයේ බිල් කිරීම් සමඟ අයවිය යුතු අක්කර බදු මුදල රු.106,517 ක් වුවද රැස් කළ ආදායම රු.5,804 ක් වීමෙන් අක්කර බදු අයවීම සියයට 05 කට අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි.<br><br>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව හිඟ අක්කර බදු අයකර ගැනීමටත්, ප්‍රදේශයේ සමීක්ෂණයක් මඟින් අක්කර බදු අය කළයුතු පාර්ශවයන් නිවැරදිව හඳුනා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට හා අක්කර බදු අය කළයුතු පාර්ශව හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සමීක්ෂණයක් මඟින් ඉදිරියේ දී හිඟ ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

**2.2.5** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.55,417 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.27,890,658 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ලිපි මඟින් ප්‍රධාන ලේකම් දැනුවත් කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා දිවිතුර වතුයායේ පර්චස් 20 ක ඉඩම් කොටසක් යොදාගෙන තිබුණි. සතියකට වරක් එකතු කරනු ලබන ටොන් 0.25 ක් පමණ ප්‍රමාණයක් වන දිරන කසළ ඉඩමට බැහැර කරනු ලබන අතර, වලවල්වලට දමා වසා දැමීමට කටයුතු කර තිබුණි. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ. | එකඟ වෙමි. |

#### (ආ) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර තිබුණ ද, නිෂ්චිත ඉලක්ක පිහිටුවා එම ඉලක්ක ලඟාකර ගැනීම් ඇගයීම සඳහා ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි. | ඇගයීමට හැකි ආකාරයට නිෂ්චිත ඉලක්ක මත .....................තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | (i) සභාවේ සේවක සංයුතියේ ද්විතීයික අංශයේ තනතුරු 07 ක පුරප්පාඩු පැවැති අතර, ප්‍රාථමික අංශයේ තනතුරු 04 ක පුරප්පාඩු හා එක් තනතුරක අතිරික්තයක් පැවතුණි. | පුරප්පාඩු විධිමත්ව බඳවා ගැනීමටත්, අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු බඳවා ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලිඛිතව දන්වා ඇත. |
| | (ii) අනුමැතියකින් තොරව බඳවා ගන්නා ලද සේවකයෙකුට සමාලෝචිත වර්ෂයේ දී වැටුප් හා දීමනා ලෙස රු.317,649 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් තනතුර විධිමත් කරගත යුතු වේ. | සභා තීරණයක් මත කොන්ත්‍රාත් රියදුරෙකු බඳවාගෙන ගෙවීම් කර ඇත. |
| (ආ) | **සේවක ණය**<br>සේවය හැර ගිය සේවකයෙකුගෙන් රු.144,706 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගතයුතු වේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.3 වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2007 වර්ෂයේ දී මිලදී ගෙන අක්‍රිය තත්ත්වයේ පැවැති රු.430,000 ක් වටිනා විදුලි ජනක යන්ත්‍රයක් සහ 2007 වර්ෂයේ දී සභාවට ලැබී තිබූ රු.220,000 ක් වටිනාකම වූ අඟුලක් භාවිතයට ගත නොහැකිව අක්‍රීය තත්ත්වයෙන් තිබුණි. | අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඇත්කඳුර පුර නැගුම ගොඩනැගිල්ලෙහි 2017 වර්ෂයේ දී සවිකර තිබූ විදුලි සෝපානය 2018 පෙබරවාරි මාසයේ සිට අක්‍රීය වී තිබුණි. | වගකීම් කාලය පිළිබඳව සොයා බලා අදාළ කොන්ත්‍රාත් ආයතනයට දැනුම් දී අළුත්වැඩියා කළ යුතු වේ. | අළුත්වැඩියාව සඳහා විශාල මුදලක් වැය වන අතර, ඉදිරියේ දී අළුත්වැඩියාව සිදු කරමි. |

**4.** **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

---------------------------------------

**4.1** **අයවැය පාලනය**

------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයක් සඳහා සලසාගෙන තිබුණු රු.10,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් ඉලක්ක වියදම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ආදායම් විෂයයන් 04 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.91,296,887 ක් වූ අතර, ඒවා සියයට 26 සිට සියයට 78 අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් ඉලක්ක ආදායම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | වියදම් විෂයයන් 04 ක එකතුව රු.16,306,010 ක් වූ ඉතිරිවීම් වූ අතර, ඒවා සියයට 25 සිට සියයට 98 අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |

**4.2** **අභ්‍යන්තර විගණනය**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අභ්‍යන්තර විගණනයක් සිදුකර ඇති බව දන්වමි. |